www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සාම සාකච්ඡා යලි ඇරඹීමට දැරෙන මෑත ම ප්‍රයත්නයන් පිලිබඳ අසාරදර්ශනයක්

**Pessimism over latest attempts to restart peace talks in Sri Lanka**

**කේ. රත්නායක විසිනි**

**2004 නොවැම්බර් 11**

බිඳ වැටීමට ඉතා ම ආසන්න ශ්‍රී ලංකාවේ සාම ක්‍රියාදාමය බේරා ගැනීමේ ජාත්‍යන්තර ප්‍රයත්නයේ කොටසක් ලෙස විදේශ ඇමති ජාන් පීටර්සන්ගේ නායකත්වයෙන් යුත් ඉහල පෙලේ නෝර්වේජියානු දූත පිරිසක් මේ සතියේ මෙරටට පැමිනියේ ය. පීටර්සන්, ඔහුගේ දෙවැනියා වන විඩාර් හෙල්ගසන් සහ විශේෂ නියෝජිත එරික් සොල්හෙයිම් එලඹෙන දින කිහිපය තුල ශ්‍රී ලංකා ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ නායක වී. ප්‍රභාකරන් සහ සෙසු දේශපාලන නායකයන් සමග සාකච්ඡා මාලාවක් පවත්වනු ඇත.

කෙසේ වෙතත්, නවතම නෝර්වේජියානු ප්‍රයත්නය කොලඹ ආන්ඩුව හා එල්ටීටීඊය අතර සාකච්ඡා යලි ආරම්භ කිරීමෙහි ලා මීට පෙර දැරුනු ප්‍රයත්නයන්ට වඩා වැඩි සාර්ථකත්වයක් අත් කර ගනිතැයි කිසිවෙකුටත් සාරදර්ශනයක් නැත. නියෝජ්‍ය විදේශ ඇමති හෙල්ගසන් සැප්තැම්බරයේ දී කොලඹට පැමින කිසිදු සාධනීය ප්‍රතිඵලයකින් තොරව ආපසු ගියේ ය. ජපානයේ විශේෂ සාම නියෝජිත යසුෂි අකාශි මෑත දී ශ්‍රී ලංකාවේ දින පහක් ගත කල අතර සාකච්ඡා ආරම්භ කිරීමෙන් තොරව ජාත්‍යන්තර ආධාර නො ලැබෙනු ඇතැයි අනතුරු ඇඟවී ය. එහෙත් ඔහු නොවැම්බර් 2 දා සිය සංචාරය අවසානයේ පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවක දී අසාරදර්ශී ලෙස මෙසේ පැවසී ය: "සාම සාකච්ඡා යලි ඇරඹීම දෙසට ප්‍රථම අඩිය තැබීමට එකදු පාර්ශ්වයකටවත් උවමනාවක් නැත."

ඊයේ කොලඹට පැමිනි පීටර්සන් ද බලාපොරොත්තු සහගත වූයේ නැත. ඔහු ගිය සතියේ දී මෙසේ ප්‍රකාශ කරමින් ප්‍රවෘත්ති නිවේදනයක් නිකුත් කලේ ය: "මෑත සති ගනනාව තිස්සේ පාර්ශ්වයන් වෙතින් ලද සංඥා මත පාදක වූ කල මට (සාම සාකච්ඡා ගැන) ඉහල බලාපොරොත්තු තබා ගත නො හැකි ය. එහෙත් අසීරු අවස්ථාවන්හි දී පාර්ශ්වයන් සමග දිගට ම කටයුතු කිරීම වුනත් වඩා වැදගත් ය." "මෙම හිරවීම ජය ගැනීමට අපට හැකි වෙයි ද යන්න පැවසීම අසීරු" බව විශේෂ නියෝජිත සොල්හෙයිම් අඟහරුවාද මාධ්‍යවලට කල අදහස් දැක්වීමක දී පිලිගත්තේ ය.

මෙම ප්‍රවේශම් සහගත අදහස් දැක්වීම් මගින් පැහැදිලි වන්නේ දෙපාර්ශ්වය අතර සාකච්ඡා දිරිගැන්වීම මෙන් ම සටන් විරාමය බිඳ වැටීමක් හා සිවිල් යුද්ධය යලි ඇවිලීමක් වලකා ගැනීම ද නෝර්වේජියානු නියෝජිත කන්ඩායමේ එල්ලය වන බව යි. 2001 අග එක්සත් ජාතික පෙරමුනු (එජාපෙ) ආන්ඩුව තේරී පත් වීමෙන් පසුව 2002 පෙබරවාරියේ දී සටන් විරාමය අත්සන් කෙරුනු අතර 2003 අප්‍රේල් මස එල්ටීටීඊය සාකච්ඡාවලින් ඉවත් වීමට ප්‍රථම සාකච්ඡා වට හයක් පැවැත්වුනි.

එල්ටීටීඊයට රට විකුනන බවට චෝදනා කරමින් කුමාරතුංග ද සිංහල ස්වෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) ඇතුලු ඇගේ සගයන් ද මිලිටරි ධුරාවලිය ද එක දිගට එල්ල කල දේශපාලන ප්‍රහාරයකට 2003 පුරා ම එජාපෙ ලක් විය. පෙබරවාරියේ දී ඇය ආන්ඩුව බලයෙන් පහ කල අතර ජවිපෙ ද ඇතුලත් ඇගේ එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) අප්‍රේල් මැතිවරනය යන්තමින් ජය ගත්තේ ය. අතිශය මංමුලා සහගත මූල්‍ය තත්වයකට මුහුන දුන් තතු තුල ඇය අංශක 180ක හැරීමක් ගෙන තමන් එල්ටීටීඊය සමග සාකච්ඡා යලි ඇරඹීමට සූදානම් බව නිවේදනය කලා ය.

කෙසේ වෙතත්, පසුගිය හය මසක කාලය තුල ඒ සම්බන්ධයෙන් කිසිදු ප්‍රගතියක් අත් පත් කර ගෙන නැත. එපමනක් නොව, එල්ටීටීඊයත් බොහෝ සෙයින් ශ්‍රී ලංකා මිලිටරියේ කොටස්වල පිටුබලය ඇතිව ක්‍රියා කරන වී. මුරලිදරන්ගේ (කරුනා) නායකත්වයෙන් යුත් නැගෙනහිර පලාතේ එල්ටීටීඊයෙන් බිඳී ගිය කන්ඩායමත් අතර ගැටුම් දිගට ම පවතින තතු යටතේ සටන් විරාමය බිඳ වැටීමක තර්ජනය වැඩෙමින් පවතී.

මෑත ම සිදුවීම්වලට මිලිටරිය සෘජුව ම සම්බන්ධ වී තිබේ. ඔක්තෝබර් 31 දා නාවික හමුදාවේ විශේෂ බලකායේ හට කන්ඩායමකට නැගෙනහිර පලාතේ ත්‍රිකුනාමලය නගරය අසල එල්ටීටීඊ කඳවුරු දෙකක් හමුවී ඒවා විනාශ කල බව කොලඹ මාධ්‍ය වාර්තා කලේ ය. නොවැම්බර් 8 දා නැගෙනහිර පලාතේ කල්කුඩා ප්‍රදේශයේ හමුදා බ්‍රිගේඩ් අන දෙන නිලධාරියාගේ වාහනයට ප්‍රහාරයක් එල්ල විය. එල්ටීටීඊය කඳවුරු සම්බන්ධයෙන් සිය වගකීම

ප්‍රතික්ෂේප කොට කල්කුඩා ප්‍රහාරය "සාම ක්‍රියාදාමය කඩාකප්පල් කිරීමට" අවශ්‍ය බලවේගවල වැඩක් යයි පවසා ඇත.

කුමාරතුංග සාම සාකච්ඡා වෙනුවෙන් ප්‍රයත්න දරන අතර හමුදාව යුද්ධය සඳහා සූදානම් වේ. ආරක්ෂක කාර්ය මන්ඩල ප්‍රධානී වයිස් අද්මිරාල් දයා සඳගිරි "ආසන්න අනාගතයේ දී උදාවිය හැකි ගැටුම් යලි ඇවිලීමේ තත්වයකට මුහුන දීමට සූදානම් වීමත් "අනාගත මිලිටරි ක්‍රියාකාරකම් සැලසුම් කිරීමත්" පිනිස "මූලෝපායික සැලසුම් කමිටුවක්" පත් කර ඇතැයි ඔක්තෝබර් අග දී *ඩේලි මිරර්* පත්‍රය වාර්තා කලේ ය. මෙම කමිටුව දැනටමත් රටේ උතුරේ හා නැගෙනහිර යුද කලාපවල සංචාරය කොට ඇති අතර ජාතික ආරක්ෂක මන්ඩලයේ සාකච්ඡා සඳහා සඳගිරිට වාර්තාවක් ඉදිරිපත් කිරීමට ද නියමිත ය.

උතුරු හා නැගෙනහිර පලාත්වල අන්තර් ස්වයං පාලන අධිකාරියක් (අයිඑස්ජීඒ) පිහිටුවීම පිලිබඳව සාකච්ඡා කරන ලෙස එල්ටීටීඊය කරන ඉල්ලීමට එරෙහිව සිංහල අන්තවාදී දේශභිතෛෂී ජාතික ව්‍යාපාරය සමග එක්ව උද්ඝෝෂනය කරන ජවිපෙ වෙතින්, එනම් ඇගේ ම පාලක සභාගය තුලින් ම, එල්ල වන විරෝධයට ද කුමාරතුංග මුහුන දී සිටී. ඔක්තෝබර් අග රත්නපුරේ පැවති රැස්වීමක දී ජවිපෙ ප්‍රකාශක විමල් වීරවංශ අයිඑස්ජීඒ "වෙනම රාජ්‍යයක් සඳහා වූ ලියවිල්ලක්" ලෙස හෙලා දැක ඒ මත පදනම්ව මොන යම් හෝ සාකච්ඡාවක් පැවැත්වීමට ඇති ඉඩ කඩ ප්‍රතික්ෂේප කලේ ය. එවන් සාකච්ඡා පැවැත්වේ නම් තමන් ආන්ඩුවෙන් ඉවත් වන බවට ද ජවිපෙ කලින් තර්ජනය කොට තිබුනි.

දේශපාලන සහයෝගය සඳහා මංමුලා සහගතව සිටින කුමාරතුංග ඊනියා සාම ක්‍රියාදාමයට සෙසු දේශපාලන පක්ෂ සහ ආන්ඩු නොවන සංවිධාන සම්බන්ධ කර ගැනීමේ උත්සාහයක් ලෙස පසුගිය මාසයේ දී සාමය හා සංහිඳියාව පිලිබඳ ජාතික උපදේශක මන්ඩලයක් කැඳවුවා ය. එහෙත් විපාර්ශ්වික එජාපෙ එයට සහභාගි වීම ප්‍රතික්ෂේප කල තතු යටතේ එම රැස්වීම නිෂ්ඵල දෙයක් බවට පත් විය. එල්ටීටීඊය සමග සාකච්ඡා පැවැත්වීමට තමන් සහාය දෙන බව එජාපෙ ප්‍රකාශ කලත් දේශපාලන අන්තරායන්ගෙන් ගහන අවිනිශ්චිත ක්‍රියාදාමයක් වෙනුවෙන් කිසිදු වගකීමක් භාර ගැනීමට එය මැලිකමක් දක්වයි.

කුමාරතුංගගේ ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) මෙන් ම එජාපෙ ද සිංහල ස්වෝත්තමවාදය තුල ගැඹුරින් ම ගිලී පවතී. ජවිපෙන් හා ශ්‍රීලනිප තුලින් එල්ල වන විවේචන වලකා ගැනීමේ උත්සාහයක් ලෙස ජනාධිපතිනිය අවධාරනය කොට ඇත්තේ අයිඑස්ජීඒ මෙන් ම යුද්ධයට අවසන් විසඳුමක් ද පිලිබඳ මොන යම් හෝ සාකච්ඡාවක් පැවැත්විය යුත්තේ ඔස්ලෝ සම්මුතියේ රාමුව තුල බව යි. ආරම්භක සාම සාකච්ඡාවලින් පසුව 2002 දෙසැම්බරයේ දී නිකුත් කල ඔස්ලෝ ප්‍රකාශය "එක්සත් ශ්‍රී ලංකාවක රාමුව තුල බලය බෙදා ගැනීමේ ෆෙඩරල් සැකැස්මක්" ඉල්ලා සිටී.

අයිඑස්ජීඒ පිලිබඳව පැවැත්වෙන ඕනෑම සාකච්ඡාවක් අවසන් විසඳුමක් ගැන සාකච්ඡාවන්ට සම්බන්ධ කල යුතු යයි කුමාරතුංග කියා සිටී. මෙය වනාහි එල්ටීටීඊයට පිලිගත නොහැකි ඉල්ලීමකි. වෙන ම රාජ්‍යයක් පිලිබඳ සිය දිගු කාලීන ඉල්ලීම අතහැර දමා ඇති එල්ටීටීඊය, දෙමල සුලුතරය අතර තමන්ට පවත්නා සහයෝගයට පිටුබලයක් සපයා ගනු පිනිස, තමන්ට අධිපති ක්‍රියාකලාපයක් ඉටු කල හැකි, අයිඑස්ජීඒ පිහිටුවිය යුතු යයි අවධාරනය කරයි. දිවයිනේ ප්‍රභූ කොටස් අතර බලය බෙදා ගැනීමේ සම්මුතියක් එල්ල කර ගත් සාම ක්‍රියාදාමයට සිංහල හෝ දෙමල සාමාන්‍ය වැඩ කරන ජනතාවගේ ශිෂ්ඨ සම්පන්න ජීවන මට්ටම් හා ප්‍රජාතන්ත්‍ර අයිතීන් පිලිබඳ ඉල්ලීම් ඉටු කිරීමේ ඉලක්කයක් කිසි දාක නො වී ය.

එල්ටීටීඊ නායකත්වය කෙරෙහි දෙමල ජනයා අතර වැඩෙන අමනාපය පිලිබඳ පැහැදිලි ම දර්ශකය නම් නැගෙනහිර කරුනා කන්ඩායම බිඳී යාමයි. සාම ක්‍රියාදාමයෙන් ලද වාසිවල විශාල පංගුවක් ඩැහැ ගත් බවට "උතුරේ නායකත්වයට" දොස් කීම මගින්, නැගෙනහිර පලාතේ දෙමල ජනයා අතර පවත්නා වෛරය ගසාකෑමට කරුනා උත්සාහ දැරී ය. එල්ටීටීඊය අප්‍රේල් මාසයේ දී කරුනා කන්ඩායම මිලිටරිමය ලෙස තලා දැමූ නමුත් එම පලාත තුල සිය පූර්න අධිකාරිය පිහිටුවා ගැනීමට එය සමත්ව නැත. එම තතු තුල එය අයිඑස්ජීඒය දකින්නේ සිය දේශපාලන බලය තහවුරු කර ගැනීමේ පහසු ක්‍රමයක් ලෙස ය.

සාම සාකච්ඡා සඳහා ආන්ඩුව ඉදිරිපත් කොට ඇති කොන්දේසි පිලිගන්නා ලෙස එක්සත් ජනපදය සහ සෙසු ප්‍රධාන බලවතුන් එල්ල කරන තියුනු පීඩනයට එල්ටීටීඊය මුහුන දී සිටී. එල්ටීටීඊය ඔස්ලෝ ප්‍රකාශනයට බැඳී නැතැයි එල්ටීටීඊයේ ප්‍රධාන සාකච්ඡාකරු ඇන්ටන් බාලසිංහම් මෑත දී අවධාරනය කලේ ය. "ශ්‍රී ලංකා ආන්ඩුව තමන්ගේ ම අදහස් හා යෝජනා සමූහයක් එල්ටීටීඊය මත බලාත්කාරයෙන් පටවනු පිනිස සිය ජාත්‍යන්තර උපායික සගයන්ගේ, ආධාර දෙන ආන්ඩුවල ක්‍රියාකාරී සහයෝගය සහිතව ප්‍රකාශයක රූපාකාරයෙන් යෝජනා ගනනාවක් සූත්‍ර ගත කොට ඇත." යැයි නොවැම්බර් මුල දී ඔහු *ටැමිල්නෙට්* වෙබ් අඩවියට පැවසී ය.

එල්ටීටීඊයට ඩිමොක්‍රැටික් ජනාධිපතිවරයකු වෙතින් වඩා සානුකම්පිත අවධානයක් ලැබෙනු ඇතැයි යන්න පිලිබඳව පැවති මොන යම් හෝ බලාපොරොත්තුවක් එක්සත් ජනපදයේ බුෂ් ආන්ඩුව යලි තේරී පත් වීම මගින් අහෝසි කෙරී තිබේ. එක්සත් ජනපදයට වැඩෙන ආර්ථික හා මූලෝපායික අවශ්‍යතා පවතින ඉන්දියානු උප-මහාද්වීපය අස්ථාවර කිරීමේ තර්ජනය මතු කරන යුද්ධයක් අවසන් කරනු පිනිස වොෂිංටනය "සාම ක්‍රියාදාමයට" පිටුබලය දී ඇත. ඒ අතර ම, එල්ටීටීඊයට හිමි වනු ඇත්තේ මොන යම් හෝ අවසන් විසඳුමක

දෙවැනි ගනයේ ක්‍රියාකලාපයක් බව සහතික කිරීමට ද එක්සත් ජනපදය අධිෂ්ඨානවත්ව සිටී.

නොවැම්බර් 3 දා ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපති කාර්යාලයේ දී ප්‍රදර්ශනය කෙරුනු වීඩියෝ පනිවිඩයක එක්සත් ජනපද නියෝජ්‍ය රාජ්‍ය ලේකම් රිචඩ් ආමිටේජ් අනතුරු අඟවා තිබුනේ "සාමකාමී හා ස්ථිර විසඳුමක් කරා ලඟා වීමට තිබූ අද්විතීය අවස්ථාවක් ගිලිහෙමින් පවතින්නේ යයි කිව හැකි" බවට යි. එල්ටීටීඊයට බැන වදිමින් ඔහු ඉල්ලා සිටියේ එය "ත්‍රස්තවාදය ප්‍රතික්ෂේප කොට යලිත් සාකච්ඡා මේසයට පැමිනිය" යුතු බව යි. මොන යම් හෝ විසඳුමක දී එල්ටීටීඊය, එහි ප්‍රධාන සාකච්ඡාමය තුරුම්පුවලින් එකක් වන, ආයුධ අතහැර දැමිය යුතු යයි ආමිටේජ් මීට පෙර අවධාරනය කොට තිබේ.

එක්සත් ජනපදය ඉහල මට්ටමේ සංචාර මාලාවක් හරහා ශ්‍රී ලංකා මිලිටරිය සමග වඩා සමීප සබඳතා වර්ධනය කර ගැනීමේ යෙදී සිටී. මෙය වනාහි එල්ටීටීඊයට එල්ල කෙරුනු නිසැක අනතුරු ඇඟවීමකට සම වන ක්‍රියාවකි. මූලෝපායික සැලසුම්කරනය සහ පිලිවෙත් සම්බන්ධ අධ්‍යක්ෂ මේජර් ජෙනරාල් කාල් අයිකන්බෙරී ඔක්තෝබර් අග දී ඉහල පෙලේ ශ්‍රී ලංකා නිලධාරින් හමු වනු පිනිස කොලඹට පැමින උතුරේ යාපන නගරයේ ද සංචාරය කලේ ය.

එක්සත් ජනපදය සමග සමීප මූලෝපායික සබඳතා තනා ගෙන සිටින ඉන්දියාව මෑත දී ශ්‍රී ලංකාව සමග ආරක්ෂක සහයෝගිතා ගිවිසුමක් අත්සන් කිරීමට එකග වී තිබේ. මෙම ගිවිසුම තවමත් ප්‍රසිද්ධ කෙරී නැති මුත් පසුගිය වසර අග දී එලිදරව් වූ විස්තර මගින් පෙන්නුම් කෙරෙන්නේ සිවිල් යුද්ධය යලි ඇවිලෙන තත්වයක දී එය ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවල ශක්තිය සැලකිය යුතු අයුරින් ඉහල දමනු ඇති බව යි. මෙම ගිවිසුම පසුගිය සතියේ කුමාරතුංගගේ පස් දින ඉන්දියානු සංචාරය තුල දී සාකච්ඡාවට භාජනය වූ ප්‍රධාන කාරනාවලින් එකක් විය.

ඉන්දියාවේ සන්නද්ධ හමුදා ප්‍රධානි එන්.සී. විජ් පසුගිය සතියේ දී ශ්‍රී ලංකාවේ සංචාරයක යෙදුනි. ඔහු ඇඟවුම් සහගත ලෙස උතුරු පලාතේ වවුනියා නගරයට ද ඉන් පසුව එල්ටීටීඊ පාලනයට යටත් ප්‍රදේශවලට මායිම් වන පරිදි පිහිටි ඕමන්තෙයි හමුදා මුර පොල කරා ද ගියේ ය. දෙරට අතර ආරක්ෂක ගිවිසුමේ වැදගත්කම අවධාරනය කරමින්, ඔහු ශ්‍රී ලංකා මිලිටරි නිලධාරින්ට පැවසුවේ සටන් විරාමය ක්‍රියාත්මකව පවතින නමුදු "සොල්දාදුවන් බඳවා ගැනීමත් ඔවුන්ගේ ධෛර්‍යය ඉහල දැමීමත් අඛන්ඩව සිදු විය" යුතු බව යි.

මෙම සංචාරයත් යෝජිත ආරක්ෂක ගිවිසුමත් එල්ටීටීඊය වෙතින් තියුනු ප්‍රතිචාරයක් අවුලුවා තිබේ. පසුගිය මස අග දී *කොටි හඬ* ගුවන් විදුලියෙන් කතා කරමින් බාලසිංහම් මෙසේ පැවසී යː "යෝජිත ගිවිසුම ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන් සහ එල්ටීටීඊය අතර තුලනය වෙනස් කොට දැනටමත් බිඳෙන සුලු සටන් විරාමය තවත් ආතතියට ලක් කරනු ඇත." ගිවිසුමෙන් අදහස් කෙරෙන්නේ "දිවයින තුල තවත් යුද්ධයක් සඳහා කටයුතු සූදානම් කෙරෙමින් පවතින" බව යයි වවුනියාවේ දෙමල මන්ත්‍රී පී. සිදම්බරන්දන් කෙලින් ම අනතුරු ඇඟවී ය.

මෑත ම නෝර්වේජියානු නියෝජිත කන්ඩායමේ සංචාරය වත්මන් හිරවීම අවසන් කොට සාම සාකච්ඡා යලි ඇරඹීමට ඇති ඉඩකඩ ඉතා ම අඩු ය. සිවිල් යුද්ධය දෙසට හෙමින් රූටා යාම දිගට ම පවතිනු ඇත.

© www.wsws.org